Temple ඇතුළුවීමේ ගාස්තුව රුපියල් 30,000 ක් වන අතර කුඩා ළමුන් සඳහා රුපියල් 15,000 ක් අය කරනු ලබනවා. Uluwatu සිද්ධස්ථාන ඉතා සුප්‍රසිද්ධ බාලි සංස්කෘතිකාංගයක් වන Kecak and fire dance show සඳහාද ප්‍රසිද්ධියක් උසුලනවා. එම ප්‍රසංග යෙන් අනතුරුව සංස්කෘතික ඇඳුමෙන් පැළඳුමෙන් සැරසුණු නර්තන ශිල්පීන් සමග ඡායාරූප ලබාගන්නටත් ඔබට අවස්ථාව හිමිවෙනවා.

දවස අවසානයේ ඔබේ නවාතැන කරා යන්නට පළමුව Jimbaran Bay වෙරළ තීරයට ගොස් ප්‍රණීත Seafood meal එකක් රස විඳින්නටත් අමතක කරන්නට එපා.

### තෙවන දිනය

අවසාන දිනය මා වෙන් කරන්නේ Ubud හි සංචාරයකටයි. බාලි දුපතේ මධ්‍යම කඳුකර ප්‍රදේශය හෙවත් Ubud පෞරාණික ආගමික සිද්ධස්ථාන හා රාජකීය මාළිග, හරිත වර්ණ කඳු පන්ති සහ නිල්වන් කෙත් වතු සඳහාත් ඉමහත් ප්‍රසිද්ධියක් උසුලනවා. Ubud නගරයට පැමිණි බොහෝ දෙනා ප්‍රථමයෙන් තෝරා ගන්නේ Ubud Art Market හි ඇවිදිමින් කාලය ගත කිරීමටයි. බාලි සංස්කෘතිය හා සබැඳුන අත්කම් භාණ්ඩ මිලදී ගැනීමට ඇති ප්‍රමුඛතම ස්ථානයක් ලෙස Ubud Art Market සඳහන් කල හැකිය. ඉන් අනතුරුව ඔබේ රුචිකත්වය අනුව Ubud Monkey Forest, Tegalalang Rice Terrace, Tegenungan දියඇල්ල, Pura Taman Saraswati සිද්ධස්ථානය, Blanco Renaissance කෞතුකාගාරය, Puri Saren රාජකීය මාලිගය හෝ Goa Gajah Elephant Cave නැරඹීමට යාමට ඔබට කාලවේලාව වෙන්කරගත හැකිය.

මා මුලින්ම සඳහන් කල පරිදි බාලි වැනි අති සුන්දර දූපතක අසිරිය විඳගැනීමට දින තුනක් වැනි කාලයක් කිසිසේත්ම ප්‍රමාණවත් නොවුනත් එවැනි කෙටි කාලයක් තුළ උපරිම ඵල නෙලා ගැනීමට මේ මඟ පෙන්වීම විශාල පිටුවහලක් වේ යැයි මාගේ විශ්වාසයයි.

**තවත් මෙවැනිම ලිපියකින් ලබන මාසයේ හමුවෙමු.**


Ubud


Ubud Art Market


Tegenungan

